Department Sabaragamuwa Province/ Weekly School Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education



## ජනකතා උපමාකතා ආදියෙහි එන සංස්කෘතික හා සාමාජික ලක්ෂණ විමසයි.

ජනකතා යනු අතීත මිනිසාගේ ජීවන රටා, විවිධ වෘත්තීන් සමග බැඳුණු සිද්ධි මත බිහි වූ කතන්දර වේ. උපමා කතා යනු යම් ආදර්ශයක් දෙන ලෙස නිර්මාණය කරන ලද කතා වේ. මිනිස් ජීවිතය යහමගට යොමු කරවන සිරිත් විරිත් මතුකර දක්වන විවිධ ග්‍රන්ථ අප සාහිත්‍යයේ ඇත. ඔබ ජනකතා උපමා කතා කියවා ඇත. අසා ඇත. එවැනි ජනකතා තුළින් තත්කාලීන සමාජ තොරතුරු හෙළි වේ.

මිනිසා ගේ සිරිත් විරිත්, ආහාර පාන, ඇදහිලි විශ්වාස, ඇඳුම් පැළඳුම් ආදී සංස්කෘතිකාංග පිළිබඳව ද කියවේ. තව ද විවිධ ජන කොටස් වලට අයත් ජනකතා වලින් හෙළිවන්නේ එකී ජන කොටස් වල සමාජ විවිධත්වය යි. ඊට අමතරව විවිධ ආගම් වලට අයත් ජනකතා තුළින්, උපමා කතා වලින් අප ජීවිතයට යහපත් ගුණ ධර්ම රැසක් එකතු වේ. දේශීය මෙන්ම විදේශීය ජනකතා ද අපට හමුවේ.

මෙසේ බලන කළ පුරාතනයේ වටිනා නාට්‍යමය ගුණයෙන් යුත් කතා හමුවේ. ජන කතා කියවා හෝ අසා රස විඳීමට පමණක් නොව, ඒවා ඇසුරින් විවිධ ක්‍රියාකාරකම් වල නිරත විය හැක. මේ අනුව තෝරා ගනු ලබන ජන කතාව අශ්‍රිතව චිත්‍ර ඇඳීම, කවි නිර්මාණය හා නාට්‍ය නිර්මාණය ආදී ක්‍රියාකාරකම් සිදු කළ හැක. මේ අනුව තෝරා ගන්නා ජන කතාව ආශ්‍රිත ව නාට්‍ය නිර්මාණයක් කරන්නේ නම් ජන කතාවෙන් ගත හැකි නාට්‍යමය ගුණාංග කෙරෙහි අවධානය යොමුකළ යුතුය. තව ද ඒවයෙහි හමුවන චරිත පිළිබඳව ද අප වඩා විමසිලිමත් විය යුතුය. නමුත් සෑම කතාවක් තුළ ම නාට්‍යමය ගුණයෙන් යුතු අවස්ථා නොමැත.

### ජන කතා ඇසුරු කර ගත් නාට්‍ය නිර්මාණ

- නරිබෑණා
- රත්තරං
- රතු හැට්ටකාරී
- වෙල්ල වැහුම්

ජන කතා ඇසුරු කර ගත් මෙකී නාට්‍ය ප්‍රේක්ෂකයාට වඩා හොඳින් සමීප වී ඇත.

නාට්‍යමය අවස්ථා ඇති ජනකතා රැසකි. එවැනි ජනකතා අතරින් නාට්‍යමය ගුණයෙන් යුතු රසවත් හා වැදගත් ජනකතා තෝරා ගැනීමට ඔබට හැකි විය යුතුය. එසේ තෝරාගන්නා

ජනකතා මගින් පරිකල්පන ශක්තිය මෙහෙයවා සාමූහිකව සාර්ථක නිර්මාණ බිහිකළ හැක. ජන සාහිත්‍ය පෝෂණයෙහි ලා එවැනි නිර්මාණ වඩා වැදගත් වේ.